# ලස්සන පවුලක්



W.M. සෙනුලි ගෙහන්සා වීරසිංහ

# ලස්සන පවුලක්


## සෙනුලි ගෙහන්සා වීරසිංහ

**කතෘ**


**කතෘගේ වෙනත් කෘති :**

- මලිඳුට පාඩමක්
- අපූරු මිතුදම
- පුංචි සුරංගනාවී
- උද්‍යානයේ පුංචි තරුව ලිලී
- **Greed costs Malidu**


| | | |
|---|---|---|
| **පාසල** | **:** | **මහ/මහාමායා බාලිකා විදුහල** |
| **ඉගෙනුම ලබන පන්තිය** | **:** | **6 ශ්‍රේණිය** |
| **කෘතිය එළ කරන දිනය** | **:** | 2026.05.10 |
| **ISBN අංකය** | **:** | **978-624-211-298-5** |

# පිදුම

මගේ ජීවිතේ ආලෝකය දුන්න,

මගේ පළමු ගුරුවරුන් වූ,

මට ආදරය, විශ්වාසය, ලියන්නට දේවල් ඉගැන්වූ

ආදරණීය **අප්පච්චිට, අම්මාට,**

මගේ හිනාවට, කඳුළට, සෙල්ලම් වලට,

සහ මගේ කතා වලට මුල්ම අහන්නන් වූ

ආදරණීය **සහෝදරයාට, අත්තාට, අත්තම්මාට**

අකුරු කියවන්න, වචන ගොතන්න, සිහින දකින්න උගන්වපු,

මගේ දෙවන දෙමාපියන් වූ

ගෞරවණීය **මහාමායා බාලිකා විද්‍යාලයේ ගුරු මහත්ම මහත්මීන්ට,**

මේ මගේ පළමු E කතා පොත

කෘතවේදීත්වයෙන්, ආදරයෙන් පුද කරමි.

**6 ශ්‍රේණිය D**

**මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර**



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

## සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිමර්ාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිමර්ාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිමර්ාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාථර්ක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිවර්ාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාථර්කත්වයක් ලබනු ඇතැයි ප්‍රාථර්නා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.

සම්මානිත මහාචාය්‍යර් , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

## සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

ගමක ලස්සන කුඩා ගෙයක් තිබුණා. ඒ ගෙදර අම්මා, අප්පච්චි, අයියා තිසලයි, නංගී ගෙහන්සයි හතර දෙනා සතුටින් ජීවත් වුණා.

තිසල හොඳට ඉගෙන ගත්ත ළමයෙක්. ගෙහන්සා පොඩි උනාට පොතට ගොඩක් ආසයි.



පාසලේ හැමෝම තිසලට ආදරේ කළා. එයා ගණිතය, විද්‍යාව ඔක්කොටම පළවෙනියා.

අප්පච්චි කියනවා, “මගේ පුතා ලොකු මනුස්සයෙක් වෙයි” කියලා. අම්මාත් සතුටින් තිසල ගැන හරි ආඩම්බරයෙන් කාලය ගත කළා.



එක දවසක් අප්පච්චි ගෙදරට පරිගණකයක් ගෙනාවා. තිසලට ගොඩක් සතුටුයි.

එයා දවසම පරිගණකේ ඉස්සරහා. මුලින් එයා පරිසනකය ගැන ඉගෙන ගත්තා, ඊට පස්සේ ගෙදර ඉන්න සෑම වෙලාවකම  පරිගණකයෙන් සෙල්ලම් කරන්න පටන් ගත්තා. ඒ විතරක් නෙවෙයි නං0ගිටත් ඒ දේවල් කියල දුන්නා.



දැන් තිසල පාඩම් කරන්න හරිම කම්මැලි. පොතක් දිග  ඇරියේ නෑ. සෑම වෙලාවකදීම “පස්සේ කරන්නම්” කිය කිය පාඩම් කරන එක කල් දානවා.

විභාගේ ලං වෙනවා කියලා තිසලට කිසිම හැඟීමක් තිබුනේ නැහැ. අම්මා අප්පච්චි තිසලගේ ක්‍රියා කලාපය ගැන හරිම කනගාටුවෙන් කාලය ගෙව්වා.



නංගි ගෙහන්සා නම් හැමදාම වෙලාවට පාඩම් කරනවා. රෑට ලයිට් දාගෙන හරි අපූරුවට පාඩම් කරනවා.

එයා හැම වෙලේම හිතනවා “මම හොදට ඉගෙන ගෙන අම්මා අප්පච්චිව සතුටු කරන්න ඕනේ” කියලා.



එක දවසක් අම්මා තිසලට කිව්වා, "පුතේ, පරිගණකේ නරක නෑ. ඒත් අපි එක පාවිච්චි කරන විදිහ අනුව තමා එක තීරණය වෙන්නේ කියලා. පරිඝණකය පාවිච්චි කරන්න නිශ්චිත වෙලාවක් තියා ගන්න කියලා. පොත් පත් වල වඩාත් කරන්න ඕනේ කියලා අම්මා තිසක්ලට පැහැදිලි කරලා දුන්නා. අපි ඔයා ගැන ගොඩක් බලාපොරොත්තු තියාගෙන ඉන්නේ."

අම්මා මොන විදිහට පැහැදිළ කලත්, තිසල අහගෙන හිටියත්, හිත වෙනස් වුණේ නෑ. එයා හැම වෙලේම ආශා කලේ පරිඝනකයේ ක්‍රීඩා කරන්න.



මේක දැක්ක ගෙහන්සා අයියා එක්ක කතා කරන්න හිතුවා. මෙහෙම හිතපු ගෙහන්සා තිසල ළඟට ඇවිත් කිව්වා, “අයියේ, ඔයා ඉස්සර කොච්චර දක්ෂද? මාත් ඔයාව වගේ වෙන්න ආසයි. අම්මයි අප්පච්චියි හැම වෙලේම මට කිවේ ඔයා වගේ හොඳට වැඩ කරන්න කියලා. එයාලා ඔයාට ගොඩාක් ආදරෙයි. ඒ නිසා එයාල ඔයා ගැන ගොඩක් දුකින් ඉන්නේ. එත් දැන් ඔයා පොත් වල වැඩ කරන්නෙම නැනේ. අපි දෙන්නා එකට පාඩම් කරමුද?” නංගිගේ ඇස්වල කඳුළු තිබුණා. අයියා දිහා හරිම දුකුන් බලාගෙන හිටියා.



ඒ රෑනම් තිසලට නින්ද ගියේම නෑ. එයාට මතක් උනෙම නංගි දවල් එයා ලගට ඇවිත් ඇස දෙකේ කඳුළු පුරවන් කියපු දේවල්. එයා හිතුවා, “මම වැරදිද කියලා. එතකොට තමා තිසලට මතක් උනේ තමන් පන්තියේ හොද ලකුණක් ගද්දි අම්මා අප්පච්චි මොන තරම්නම් සතුටු උනාද කියලා. දැන් තමන් පාඩම් වැඩ ගැන උනන්දුවක් නැති නිසා එයාලා මොන තරම් නම් දුකකින් ඉන්නවද කියලා . අම්මා අප්පච්චි මහන්සි වෙන්නේ නංගියි මමයි වෙනුවෙන් නේද කියලා තිසලට දැනුනා.

නංගිටත් මාව විශ්වාස ගොඩක් කරනවා.” ඒ වගේම මම ගැන ගොඩක් කනගාටු වෙනවා කියලා තිසලට තේරුනා. පහුවදා ඉඳලා එයා ආයෙත් පාඩම් පටන් ගත්තා.



විභාගේ දවස ආවා. තිසල තමන් පාඩම් කරපු කරුණු මතක් කරගෙන හොඳින් විභාගයට මුහුණ දුන්නා. තිසල වගේම ගෙහන්සත් හොඳට විභාගයට මුහුණ දුන්නා.

කාලය ගතවෙමින් ප්‍රතිඵ නිකුත් කරන දවස උදා උනා. ප්‍රතිඵල ලේඛනයට අනුව  තිසල සමත්! තිසලට එයාගේ මහන්සියට ප්‍රතිඵල ලැබුනා. ගෙහන්සත් පන්තියේ පළවෙනියා. ගෙදර හැමෝම සතුටින් වැලඳ ගත්තා.



දැන් තිසල නිශ්චිත වෙලාවකට විතරක් පරිඝනකය පාවිච්චිකරනවා. පොත් පත් වල වඩාත් ඉතාම උනන්දුවෙන් කරනවා. නංගිටත් පාඩම් වැඩ වලට උදව් කරනවා.  එයාම නංගිටත් කියනවා, “වැරදි හදා ගත්තොත් ජය ලබන්න පුළුවන් කියලා.”

දැන් ඒ ගෙදර ආයෙත් සතුට පිරුණා. අම්මා, අප්පච්චි, නංගි හා තිසල ඉතාම සතුටින් සමගියෙන් කාලය ගත කළා.





## පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)